# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. } ED/01/09/06/01/05-2021 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. } | දිනය / திகதி / Date } 2020.11. 11

Information & Communication Technology Branch
18 NOV 2020
Ministry of Education "Isurupaya", Battaramulla.

චක්‍රලේඛ අංක - 33/2020

සියලු ම පළාත් ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නි.අ.අ./ස.අ.අ.වරුන්,
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්,
සියලු ම රජය හා රජය අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

## පාසල් වාර සටහන - 2021

01. 2021 වර්ෂය තුළ අනුගමනය කළ යුතු පාසල් වාර සටහන සහ අදාළ විස්තර පහත දැක්වේ.

I. සිංහල හා දෙමළ පාසල් සඳහා

| | |
|---|---|
| පළමුවන වාරය | <u>පළමු වන අදියර</u><br>2021 ජනවාරි මස 04 වන සඳුදා සිට 2021 ජනවාරි මස 15 වන සිකුරාදා දක්වා (දෙදිනම ඇතුළු ව)<br>( අ.පො.ස. (සා/පෙළ) විභාගය -2020 පැවැත්වීමට නියමිත බැවින් 2021.01.16 දින සිට 2021.01.31 වන දින දක්වා නිවාඩු ලබා දෙනු ලැබේ)<br><u>දෙවන අදියර</u><br>2021 පෙබරවාරි මස 01 වන සඳුදා සිට 2021 අප්‍රේල් මස 09 වන සිකුරාදා දක්වා (දෙදින ම ඇතුළු ව) |
| දෙවන වාරය | 2021 අප්‍රේල් මස 19 වන සඳුදා සිට 2021 ජූලි මස 30 වන සිකුරාදා දක්වා (දෙදින ම ඇතුළු ව) |
| තෙවන වාරය | 2021 අගෝස්තු මස 30 වන සඳුදා සිට 2021 දෙසැම්බර් මස 03 වන සිකුරාදා දක්වා (දෙදින ම ඇතුළු ව) |

II. මුස්ලිම් පාසල් සඳහා

| | |
|---|---|
| පළමුවන වාරය | <u>පළමු වන අදියර</u><br>2021 ජනවාරි මස 04 වන සඳුදා සිට 2021 ජනවාරි මස 15 වන සිකුරාදා දක්වා (දෙදිනම ඇතුළු ව)<br>( අ.පො.ස. (සා/පෙළ) විභාගය -2020 පැවැත්වීමට නියමිත බැවින් 2021.01.16 දින සිට 2021.01.31 වන දින දක්වා නිවාඩු ලබා දෙනු ලැබේ.)<br><u>දෙවන අදියර</u><br>2021 පෙබරවාරි මස 01 වන සඳුදා සිට 2021 අප්‍රේල් මස 09 වන සිකුරාදා දක්වා (දෙදින ම ඇතුළු ව)<br>(රාමසාන් උපවාසය සඳහා 2021.04.10 සිට 2021.05.16 දක්වා නිවාඩු ලබා දෙනු ලැබේ.) |
| දෙවන වාරය | 2021 මැයි මස 17 වන සඳුදා සිට 2021 අගෝස්තු මස 25 වන බදාදා දක්වා (දෙදින ම ඇතුළු ව)<br>(2021 අගෝස්තු මස 26 හා 27 යන දෙදින නිවාඩු ලබා දෙනු ලැබේ.) |
| තෙවන වාරය | 2021 අගෝස්තු මස 30 වන සඳුදා සිට 2021 දෙසැම්බර් මස 03 වන සිකුරාදා දක්වා (දෙදින ම ඇතුළු ව) |

කරු.අ.පි.බ.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister } +94112784832 | +94112784825 | minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary } +94112784811 | +94112785162 | secretary.education@moe.gov.lk

02. ඒ ඒ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවලට තම පළාත්වල සුවිශේෂී තත්වයනට අනුකූලව පාසල් වාර සටහන වෙනසක් කළ යුතු බව අදහස් කරන්නේ නම් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව හා 1997 අගෝස්තු මස 08 දිනැති අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම්ගේ අංක 97/15 දරණ චක්‍රලේඛයට අනුව මෙම වාර සටහන වෙනස් කර ගත හැකිය.

2.1 පාසල් වාර සටහන සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1997 අගෝස්තු මස 08 දිනැති අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම්ගේ අංක 97/15 දරණ චක්‍රලේඛයට අනුව ලංකාවේ සියලුම පාසල් දින 210ක් පැවැත්විය යුතු බව අවධාරණය කර ඇතත්, 2021 වර්ෂයට යෙදෙන රජයේ නිවාඩු දිනයන් අනුව දින 210ක් පාසල් පැවැත්වීමට නොහැකි වී ඇත. එබැවින් 2021 වර්ෂය සඳහා රජයේ හා රජයේ අනුමත සියලු ම පෞද්ගලික පාසල් හා අනුමත පිරිවෙන්, දින 188ක් පැවැත්විය යුතු වේ.

2.2 2021 වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගය අගෝස්තු මාසය තුළ හා අ.පො.ස. (සා/පෙළ) විභාගය දෙසැම්බර් මාසය තුළ දී පැවැත්වීමට නියමිතව ඇති බැවින්, පාසල්වල අගෝස්තු හා දෙසැම්බර් නිවාඩු කාල සීමාවන් වාර සටහනෙහි දක්වා ඇති ආකාරයෙන් ම පැවැත්විය යුතු වේ.

03. රජය මඟින් ප්‍රකාශිත ප්‍රසිද්ධ නිවාඩු දින, සෙනසුරාදා, ඉරිදා දිනයන් හා වාර නිවාඩු කාලයන් තුළ සියලු ම පාසල් වසනු ලැබේ. එහෙත් සුවිශේෂී හේතුවක් මත පාසල පැවැත්විය යුතු දිනයක පාසල වැසීමට සිදු වුවහොත් එම දින සඳහා හිලව් සැසි පැවැත්විය යුතු වේ.

04. 2021 වර්ෂයට අදාළ රජයේ නිවාඩු දින දර්ශනය මේ සමඟ ඔබ වෙත යොමු කරන අතර (ඇමුණුම- I), පාසල් ක්‍රියාකාරකම් ඇතුළත් දින දර්ශනය ඉදිරියේ දී අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි (www.moe.gov.lk) පළකිරීමට කටයුතු කරනු ලැබේ.

**මෙම වාර සටහන ක්‍රියාත්මක කිරීමේ දී යම් ගැටළුවක් පැන නැගුණහොත් ඒ සම්බන්ධයෙන් පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් විමසන මෙන් කාරුණිකව ඉල්ලමි.**

දුරකථන අංක - 011- 2784845

මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

1. රාජ්‍ය ලේකම්, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා අමාත්‍යාංශය
2. රාජ්‍ය ලේකම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන අමාත්‍යාංශය
3. රාජ්‍ය ලේකම්, නිපුණතා සංවර්ධන, වෘත්තිය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අමාත්‍යාංශය
4. රාජ්‍ය ලේකම්, දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන අමාත්‍යාංශය
5. අධ්‍යක්ෂ ජනරාල් (ජාතික අධ්‍යාපන ආයතනය)
6. විභාග කොමසාරිස් ජනරාල්
7. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
8. ප්‍රධාන කොමසාරිස් - ගුරු අධ්‍යාපන
9. අධ්‍යාපන අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන්
10. සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
11. සභාපති, මධ්‍යම ගමනාගමන මණ්ඩලය

# රජයේ නිවාඩු දින - 2021

| | | | | |
|---|---|---|---|---|
| ජනවාරි | 14 | බ්‍රහස්පතින්දා | දෙමළ තෛපොංගල් දිනය | * = |
| ජනවාරි | 28 | බ්‍රහස්පතින්දා | දුරුතු පුර පසළොස්වක පෝය දිනය | * = |
| පෙබරවාරි | 04 | බ්‍රහස්පතින්දා | නිදහස් සමරු දිනය | * = |
| පෙබරවාරි | 26 | සිකුරාදා | නවම් පුර පසළොස්වක පෝය දිනය | * = |
| මාර්තු | 11 | බ්‍රහස්පතින්දා | මහා සිව රාත්‍රී දිනය | * = |
| මාර්තු | 28 | ඉරිදා | මැදින් පුර පසළොස්වක පෝය දිනය | * = |
| අප්‍රේල් | 02 | සිකුරාදා | මහ සිකුරාදා දිනය | * = |
| අප්‍රේල් | 13 | අඟහරුවාදා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනට පෙර දිනය | * = |
| අප්‍රේල් | 14 | බදාදා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය | * = |
| අප්‍රේල් | 26 | සඳුදා | බක් පුර පසළොස්වක පෝය දිනය | * = |
| මැයි | 01 | සෙනසුරාදා | ලෝක කම්කරු දිනය | * = |
| මැයි | 14 | සිකුරාදා | ඊදුල් ෆිතර් (රාමසාන් දිනය) | * = |
| මැයි | 26 | බදාදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනය | * = |
| මැයි | 27 | බ්‍රහස්පතින්දා | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය | * = |
| ජූනි | 24 | බ්‍රහස්පතින්දා | පොසොන් පුර පසළොස්වක පෝය දිනය | * = |
| ජූලි | 21 | බදාදා | ඊදුල් අල්හා (හජ්ජි උත්සව දිනය) | * = |
| ජූලි | 23 | සිකුරාදා | ඇසළ පුර පසළොස්වක පෝය දිනය | * = |
| අගෝස්තු | 22 | ඉරිදා | නිකිණි පුර පසළොස්වක පෝය දිනය | * = |
| සැප්තැම්බර් | 20 | සඳුදා | බිනර පුර පසළොස්වක පෝය දිනය | * = |
| ඔක්තෝබර් | 19 | අඟහරුවාදා | (මිලාද්-උන්-නබි) නබි නායකතුමාගේ උපන් දිනය | * = |
| ඔක්තෝබර් | 20 | බදාදා | වප් පුර පසළොස්වක පෝය දිනය | * = |
| නොවැම්බර් | 04 | බ්‍රහස්පතින්දා | දීපවාලි උත්සව දිනය | * = |
| නොවැම්බර් | 18 | බ්‍රහස්පතින්දා | ඉල් පුර පසළොස්වක පෝය දිනය | * = |
| දෙසැම්බර් | 18 | සෙනසුරාදා | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය | * = |
| දෙසැම්බර් | 25 | සෙනසුරාදා | නත්තල් උත්සව දිනය | * = |

* රජයේ නිවාඩු දින = බැංකු නිවාඩු දින